රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site

---

මගේ අංකය / எனது இல / My No: PS/GT/2020 (IV වෙළුම)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.05.05

සියලු ම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්/පළාත් ප්‍රධාන ලේකම්වරුන්

රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

කොමිෂන් සභා ලේකම්වරුන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රැකියා විරහිත උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020</u>**

උක්ත වැඩසටහනට අනුව ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයට අනුව ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරි සේවයේ ස්ථිර පත්වීම් ලබා දීමේ කටයුතු මේ වනවිට අවසන් වෙමින් පවතී. විවිධ ගැටලු මත රඳවාගෙන ඇති පත්වීම් සහ පළාත් ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුව ඇති නම් සම්බන්ධව ඇති සියලු කටයුතු මේ වනවිට අවසන් කොට ඇත.

02. ඒ අනුව ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරි සේවයට 2022.01.03 දින සහ 2022.04.01 දිනැතිව පත්කරන ලද නිලධාරින් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු වේ.

I. ඒකාබද්ධ සේවයට ස්ථිර පදනමින් ඉහත දින පත්වීම් දින ලෙස සලකා පත් කරන ලද සියලු ම සංවර්ධන නිලධාරින් 2022.05.09 දින වන විට අනුයුක්ත කරන ලද සේවා ස්ථානවල රාජකාරි බාර ගැනීමට කටයුතු කළ යුතුය. එසේ රාජකාරි බාර ගැනීමට අපොහොසත් වන නිලධාරින්ගේ පත්වීම ක්‍රියාත්මක වන දිනය සම්බන්ධව ගනු ලබන තීරණය එම නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨතාවට බලපෑමක් ඇතිකළ හැකි වේ.

II. පළාත් සභා මගින් මෙතෙක් පත්වීම් ලබා දී නොමැති සංවර්ධන නිලධාරියෙකු හැර වෙනත් කිසිදු අභ්‍යාසලාභියෙකු 2022.05.09 දින වන විට අභ්‍යාසලාභී දීමනාව ලබන තත්ත්වයේ නොසිටිය යුතු ය. ඒ අනුව ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරි සේවයට ස්ථිර පදනමින් පත්කිරීමට නියමිත අභ්‍යාසලාභීන් සඳහා රු20000/= දීමනාව ගෙවනු ලබන්නේ අප්‍රේල් මාසය සඳහා පමණි.

III. කෙසේ වෙතත් පළාත් සභාවලට/පළාත් පාසල්වලට පත්වීම් ලැබීමට අපේක්ෂිත අභ්‍යාසලාභී උපාධිධාරීන් සඳහා අදාළ පළාත් සභාවල ඉල්ලීම් සලකා බලා මැයි මස සඳහා පමණක් වන අභ්‍යාසලාභී දීමනාව සඳහා ප්‍රතිපාදන ලබා දීමට හැකියාව පවතී.

IV. ඉහත බඳවා ගැනීමට අදාළ විධිමත් සම්මුඛ පරීක්ෂණය සිදුකරන ලද්දේ ප්‍රාදේශීය ලේකම්වරු විසිනි. ඒ සම්බන්ධයෙන් දීර්ඝ උපදෙස් මාලාවක් නිකුත් කිරීමට මා විසින් කටයුතු කරන ලදී. එම උපදෙස් මත බොහෝදුරට සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුන ද යම් යම් හේතූන් මත (අයදුම්කරු විසින් සත්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම, ඉදිරිපත් වූ ලේඛනවල අඩුපාඩු) වැනි කරුණු මත මූලික සුදුසුකම් නොමැති පුහුණුවේ රැඳී සිටින අභ්‍යාසලාභීන් යම් ප්‍රමාණයක් ද වේ. ඔවුන් බොහෝදුරට හඳුනාගෙන පුහුණුව අවසන් කිරීමට කටයුතු කරන ලදී. එහෙත් යම් යම් කාරණා මත අභ්‍යාසලාභී පදනමින් එවැනි අභ්‍යාසලාභීන් තවදුරටත් පුහුණු දීමනා ලබාගනිමින් පුහුණුවේ රැඳී සිටීමට ද, ඇතැම්විට ස්ථිර පත්වීම් ලබා තිබීමට ද අවකාශ ඇත. ඒ අනුව එවැනි අභ්‍යාසලාභීන් හෝ ස්ථිර පත්වීම් නිකුත් කළ නිලධාරීන් වෙත් නම් එම පුහුණු පත්වීම් ලිපි/ස්ථිර පත්වීම් ලිපි අවලංගු කිරීම සඳහා මා වෙත යොමු කිරීමට අදාළ ආයතන ප්‍රධානීන් නොපමාව කටයුතු කළ යුතුය. මේ සම්බන්ධව විධිවිධාන මෙම බඳවා ගැනීමට අදාළව මා විසින් නිකුත් කළ සංවර්ධන නිලධාරී ස්ථිර පත්වීම් ලිපියේ අංක 22 දරන ඡේදයේ ද, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද පුහුණු පත්වීම් ලිපියේ අංක 08 දරන ඡේදයේ ද ඇතුළත්ව ඇති බව සැලකුව මැනවි.

- මෙම වැඩසටහන යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිනොගත් ප්‍රථම උපාධි ලැබූ අයදුම්කරුවන් සඳහා පත්වීම් ලබාදීමට විධිවිධාන නොමැත. ඒ අනුව මා විසින් 2020.08.24 දිනැතිව ලබාදුන් සම්මුඛ පරීක්ෂණ උපදෙස්වලට අනුව විදේශ උපාධි පත්වීමක් සඳහා වලංගු නොවේ.

- එමෙන්ම 2020.09.15 දින වන විට රැකියා විරහිතව නොසිටි අභ්‍යාසලාභීන්ට පත්වීම් ලබා දීමට විධිවිධාන ද නොමැති බව ද මෙහිදී සැලකිල්ලට ගත යුතුය.

03. ඉහත වැඩසටහන යටතේ පළාත් සභා/පළාත් පාසල්වලට සංවර්ධන නිලධාරී පත්වීම් ලබාදීමේ ක්‍රියාවලිය සම්බන්ධ කටයුතු මෙම මස තුළ අවසන් කිරීමට පළාත් සභා විසින් කටයුතු කිරීම සුදුසු වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය